මේ වන විට, රටක් වශයෙන් අපි ආර්ථිකමය හා දේශපාලනික අර්බුදකාරී කාලයක් තුළින් ගමන් කරමින් සිටින්නෙමු. එවන් විටක, එම අර්බුදකාරී තත්වයට අදාළව දිවි තොර කරගැනීමක් සිදුවූ විටකදී, එය වාර්තා කරන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් මාධ්‍ය විශේෂ ප්‍රවේසමක් අනුගමනය කළ යුතු වේ. එසේම, එවැනි අවස්ථාවක මහජන බැඳියාවට අයත් කරුණු සහ අනුකාරක දිවි තොර කරගැනීම් සඳහා පෙළඹවීම් සිදු කළ හැකි කරුණු සමබරතාවකින් යුතුව විමසා බලා ඉදිරිපත් කළ යුතු වේ.

එසේ නොමැති විට, එම තත්වය තමන් හා අනන්‍ය කර ගැනීමට පෙළඹෙන තවත් බොහෝ දෙනෙකු සිටිය හැකි බැවින්, දිවි තොර කරගැනීම් වසංගතයක් නිර්මාණය වීමේ හැකියාවක් තිබේ.
මීට උදාහරණ ලෙස, අප්‍රේල් 29, 2022 දින ආර්ථික පීඩනය දරා ගැනීමට නොහැකි වීමෙන් ගල්ගමුවේ අයෙකු දිවි තොර කරගත් බවට මාධ්‍ය විසින් වාර්තා කරනා සිදුවීම ගත හැක.

1) එවැනි සිදුවීමක් වාර්තා කිරීමේදී, දිවි තොර කරගත් ආකාරය හෙළි නොකිරීම, අනුකාරක දිවි තොර කර ගැනීම් වැළැක්වීමට පිටුවහලක් වනු ඇත.
2) එසේම, මෙවැනි පුවත් සමගින් හදිසි උපකාරක අංක සඳහන් කිරීම ඔස්සේ, දිවි තොර කරගැනීමේ නැඹුරුතාවක් ඇති තවත් අයගේ ජීවිත බේරාගැනීමේ අවකාශයක් නිර්මාණය කිරීමේ හැකියාවක් ද ලැබෙනු ඇත.

ඒ අනුව, දිවි තොර කරගැනීම් වාර්තා කිරීම පිළිබඳ මාර්ගෝපදේශයන්ට අනුකූලව සහ වඩාත් ප්‍රවේසම් සහගතව මෙම පුවත වාර්තා කිරීම සඳහා විකල්ප ආකාරයක් නොමැත්තේ ද? ඔබේ අදහස?

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

මූලාශ්‍ර:

https://www.nytimes.com/.../the-science-behind-suicide...
https://pressgazette.co.uk/sucide-reporting-advice/
https://media.samaritans.org/.../Samaritans_Media...
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...